# කුල අනන්‍යතාවය සහ සේවා සඳහා ප්‍රවේශය : යාපනය දිස්ත්‍රික්කයේ සිදු කළ අධ්‍යයනයේ ප්‍රතිඵල



*Image courtesy - Gayathri Lokuge*

## සාරාංශය

උතුරේ ජනතාවට ජලය, සනීපාරක්ෂාව හා අධ්‍යාපනය යන සේවාවන් සම්පාදනය කෙරෙන ආකාරය සහ ඔවුන් එම සේවාවන් වෙත ප්‍රවේශ වන ආකාරය පිළිබඳව තොරතුරු ඇත්තේ ඉතාම සුළු වශයෙනි. 2009 වසරේ යුද්ධය අවසන් වීමෙන් පසු අවධිය සම්බන්ධයෙන් මෙය විශේෂයෙන් ම සත්‍ය වේ. එවැනි මූලික සේවාවන් වෙත ප්‍රවේශ වීමේදී පන්ති හා කුල අතර පවත්නා වෙනස්කම් බලපෑ හැකි අතර ඒ පිළිබඳව ද ඇත්තේ ඉතා ම සුළු අවබෝධයකි. එවැනි දැනුමක් නැති හෙයින් ආන්තීකරණයට ලක්වූ ජන කණ්ඩායම්වලට ඔරොත්තු දෙන ජීවනෝපායන් ගොඩ නගා ගත හැක්කේ කෙසේ ද යන්න අවබෝධ කර ගැනීම ද දුෂ්කර ය. මූලික සේවාවන් වෙත ප්‍රවේශ වීමේ දී කුල අනන්‍යතාව බලපාන ආකාරය වඩාත් හොඳින් අවබෝධ කර ගැනීම සඳහා දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) යාපනයේ පිහිටි පීඩිත කුලවලට අයත් ජනයා වාසය කරන ජනාවාස දෙකක් තෝරා ගෙන අධ්‍යයනයක් සිදු කළ අතර සුරක්ෂිත ජීවනෝපාය පර්යේෂණ සමූහායතනය (SLRC) ඒ සඳහා අරමුදල් සම්පාදනය කළේය. අදියර දෙකකින් සිදු කෙරුණු මෙම අධ්‍යයනය සඳහා ප්‍රජා සාමාජිකයන්, රජයේ නිලධාරීන් හා සේවා සම්පාදකයන් සමග පැවැත්වෙන අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡාවලින් ද එමගින් සැපයෙන තොරතුරු වඩාත් පරිපූර්ණ කර ගැනීම සඳහා කෙරෙන නොවිධිමත් සාකච්ඡා හා නිරීක්ෂණවලින් ද සමන්විත ක්‍රමවේදයක් යොදා ගන්නා ලදි. පදිංචි ස්ථානය සහ කුල අනන්‍යතාව අතර ප්‍රබල සහසම්බන්ධයක් පවතින බව අධ්‍යයනයෙන් සොයා ගැනිණ. එවැනි ප්‍රජාවන්ට දරිද්‍රතාවෙන් ගැලවීමට ‘නොහැකි’ වී ඇත්තේ ඔවුන් තුළ දරිද්‍රතා සංස්කෘතියක් පවතින නිසා යැයි රජයේ නිලධාරීන් තර්කයක් ඉදිරිපත් කළ නමුත් පරම්පරා ගණනාවක් තිස්සේ මෙම ප්‍රජාවන්ට ප්‍රගතියක් අත් කර ගත නොහැකි වූයේ ව්‍යුහාත්මක අසමානතාවන් නිසා බව සහ ප්‍රජාවන්ට එය තියුණු ලෙස දැනෙන බවද අධ්‍යයනයේ දී පැහැදිලි විය. ජලය වෙත පවත්නා ප්‍රවේශය ඉතා විශාල ගැටලුවක් නොවුණත් වැසිකිළි පහසුකම් වෙත ප්‍රවේශය නොමැතිකම පිරිමින්, කාන්තාවන් හා ළමයින් එළිමහනේ මලපහ කිරීමට හේතු වී ඇත. පාසල්වලට ඇතුළත් කර ගැනීම ප්‍රමාණවත් ලෙස සිදු වුව ද වඩාත් උසස් තත්ත්වයේ පාසල් වෙත ප්‍රවේශ වීමට නොහැකි නිසා බොහෝ දෙනෙකුට පාසල් අධ්‍යාපන අත්දැකීම ප්‍රමාණවත් ලෙස ලබා ගැනීමට නොහැකි විය. මෙම ජනාවාස දෙකේ දී කුල අනන්‍යතාව සහ පදිංචි ස්ථානය අතර පවත්නා සම්බන්ධතාව සනීපාරක්ෂක හා අධ්‍යාපනික පහසුකම් වෙත පවත්නා ප්‍රවේශය තීරණය වීමට බලපාන බව මේ අනුව පැහැදිලි ය. රජයේ සහ පළාත් පාලන ආයතනවල බලධාරීන් මෙම ගැටලු විසඳීම සහ විශේෂයෙන් ම පීඩිත කුලවල ජනයා පදිංචිව සිටින ඉඩම්වලට අවශ්‍ය කරන නීතිමය ලියකියවිලි ලබා ගැනීම සඳහා ප්‍රවේශය සලසා දී වෙනත් ප්‍රජාවන්ට මූලික සේවාවන් වෙත පවත්නා ප්‍රවේශය මෙම ප්‍රජාවන් දෙකට ද තිබෙන බව සහතික කිරීම තීරණාත්මක ලෙස වැදගත් වන්නේ එහෙයිනි.

## හැඳින්වීම

2009 වසරේ යුද්ධය අවසන් වීමෙන් පසුව යුද්ධයෙන් පීඩාවට පත් උතුරේ ජනතාව මූලික සේවාවන් වෙත ප්‍රවේශ වීම සම්බන්ධයෙන් පවත්නා ගැටලු කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කර නැත. මෙම ප්‍රදේශයේ ජනතාවට මූලික අවශ්‍යතාවන් ලෙස සැලකෙන ජලය, සනීපාරක්ෂාව හා අධ්‍යාපනය වැනි සේවාවන් සම්පාදනය කෙරෙන ආකාරය සහ ඔවුන් එම සේවාවන් වෙත ප්‍රවේශ වන ආකාරය පිළිබඳව තොරතුරු ඇත්තේ ඉතාම සුළු වශයෙනි. සාම්ප්‍රදායිකව ආන්තීකරණයට ලක්වූ ප්‍රජාවන්ට සේවාවන් සම්පාදනය කිරීමේ දී සහ එම ප්‍රජාවන් සේවාවන් වෙත ප්‍රවේශ වීමේ දී කුලය පදනම් කර ගෙන වෙනස්කම් කිරීම බෙහෙවින් සිදු වන නිසා මෙම තත්ත්වය තව දුරටත් සංකීර්ණ වේ. සුරක්ෂිත හා ඔරොත්තු දෙන ජීවනෝපායන් ගොඩ නගා ගැනීමට කාන්තාවන්ට, පිරිමින්ට හා ළමයින්ට තිබෙන හැකියාව උසස් තත්ත්වයේ සේවා සම්පාදනය වෙත ප්‍රවේශය නොමැතිකම නිසා සීමා විය හැකි අතර දීර්ඝ කාලයක් තිස්සේ අත්විඳින ආන්තීකරණයන් සහ දරිද්‍රතාව තව දුරටත් බලපෑමක් විය හැකි නිසා එවැනි සියුම් වෙනස්කම් අවබෝධ කර ගැනීම අතිශයින්ම වැදගත් වේ.

කුලය පදනම් කර ගෙන වෙනස්කම් කිරීම සමාජීය නොහැකියාවන් වැළැක්වීමේ පණත (1957) යටතේ ශ්‍රී ලංකාව තුළ දී දඬුවම් ලැබිය හැකි වරදක් වුව ද කුලය ගැන සාකච්ඡා කිරීම තවමත් සංවේදී කාරණයක්ව පවතී. කුලය බොහෝ දුරට අදෘශ්‍යමානව පවතින්නක් වන අතර ප්‍රසිද්ධ කතිකාව තුළ දී ගැටලුවක් ලෙස සලකා සාකච්ඡාවට ලක් වන්නේ කලාතුරකිනි. මීට විවිධ හේතු බලපාන අතර බ්‍රිතාන්‍ය පරිපාලනය දත්ත සංගණනයේ දී යොදා ගත් සහ මේ දක්වා යොදා ගැනෙන වඩාත් පුළුල් ජනවාර්ගික වර්ග කිරීම් තුළට උකහා ගනු ලැබීම නිසා කුල වෙනස්කම් සැඟවී ගොස් තිබීම ද එක් හේතුවක් වන අතර සිංහල හා දෙමළ ජාතිකවාදී කතිකාවට අන්තර්ගත වීම නිසා ද කුලය දේශපාලනිකව සංවේදී, ප්‍රසිද්ධියේ සාකච්ඡා නොකළ යුතු විෂයක් බවට පත්ව ඇත. කුලය පදනම් කර ගෙන වෙනස්කම් කිරීමට විසඳුම් වශයෙන් කවරාකාර හෝ පිළිගත් පියවරක් නොමැතිකම ද සැලකිය යුතු කරුණක් වන අතර මීට බොහෝ දුරට හේතු වී ඇත්තේ ශ්‍රී ලාංකික සුභසාධන රාජ්‍යය සහ අධ්‍යාපනය හා සෞඛ්‍ය රැකවරණය වෙත ඉන් සැලසෙන නිදහස් ප්‍රවේශය නිසා එවැනි සමාජීය නොහැකියාවන් අවම හෝ තුරන් වන බවට සහ එම නිසා එවැනි පිළිගත් පියවරයන් අවශ්‍ය නොවන බවට ඉදිරිපත් කෙරෙන තර්ක ය.

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) කුල අනන්‍යතාව සේවාවන් වෙත පවත්නා ප්‍රවේශය කෙරෙහි බලපාන ආකාරය විමසා බලමින් යාපනයේ පිහිටි පීඩිත කුලවලට අයත් ජනයා වාසය කරන ජනාවාස දෙකක් තුළ අධ්‍යයනයක් සිදු කළේ කුලය තවදුරටත් වැදගත් වන්නේ දැයි වඩාත් ගැඹුරින් අවබෝධ කර ගැනීම පිණිස ය.

අදියර දෙකකින් කෙරුණු මෙම අධ්‍යයනයට ක්ෂේත්‍රය තුළ කරන ලද පුළුල් පර්යේෂණයක් ද ඇතුළත් විය. ආරම්භක අදියරේ දී අධ්‍යයනය සඳහා තෝරා ගත්තේ යාපනය නගරයට ආසන්නව පිහිටි ප්‍රමාණවත් සේවා සම්පාදනයක් සිදු නොවන ජනාවාස ප්‍රදේශයකි. 2013 සැප්තැම්බර් සිට 2014 ජනවාරි දක්වා වූ තුන් මසක කාල පරිච්ඡේදය තුළ දත්ත රැස් කරන ලදි. ප්‍රජාවට අයත් පිරිමින්, කාන්තාවන් හා ළමයින් ද කොට්ඨාස හා දිස්ත්‍රික්ක මට්ටමේ ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරීන් හා වෙනත් සේවා සම්පාදකයන් ද සමග සමස්තයක් ලෙස අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා 45ක් පවත්වන ලදි. පර්යේෂකයා නිතිපතා ප්‍රජාව වෙත චාරිකා කළ නිසා ප්‍රජා සාමාජිකයන් සමග නොවිධිමත් සාකච්ඡා පැවැත්වීමට ද හැකි වූ අතර ජල හා සනීපාරක්ෂක පහසුකම් වෙත පවත්නා ප්‍රවේශය සම්බන්ධයෙන් එදිනෙදා සිදු වන කතිකාවන් නිරීක්ෂණය කිරීමට ද හැකි විය. එම නිසා පර්යේෂකයාට ජනතාව පැවසූ දෙය සහ ජනතා ක්‍රියාකාරීත්වය අන්‍යෝන්‍ය වශයෙන් සසඳා බැලීමටත් ඒවා අතර පවත්නා වෙනස වටහා ගැනීමටත් අවස්ථාව ලැබිණ.

දෙවන අදියරේදීත් මෙම ක්‍රමවේදය ම යොදා ගැනුණු අතර අච්චුවේලි කොට්ඨාසයේ පිහිටි ජනාවාසයක් ඒ සඳහා තෝරා ගන්නා ලදි. දින 14ක කාල පරිච්ඡේදයක් තුළ දී සමස්තයක් ලෙස අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා 31ක් පවත්වන ලදි. සම්මුඛ සාකච්ඡා මගින් රැස් කර ගන්නා ලද තොරතුරු වඩාත් පරිපූර්ණ කර ගැනීම සඳහා නිරීක්ෂණ සහ නොවිධිමත් සාකච්ඡා ද කරන ලදි.

## ප්‍රතිඵල

පදිංචි ස්ථානය, ජීවනෝපායන් සහ කුලය අතර ප්‍රබල සම්බන්ධතා පැවතීම ප්‍රජාවන් දෙකටම පොදු ලක්ෂණයක් බව සොයා ගැනිණ. විශේෂයෙන් ම කුලය පදනම් කර ගත් සාම්ප්‍රදායික වෘත්තීන්හි නිරත වන අය අතර මෙම තත්ත්වය දක්නට ලැබිණ. රජයේ නිලධාරීන් හා සේවා සම්පාදකයන් මෙම ප්‍රජාවන් දෙක තුළ පවත්නා දරිද්‍රතාව දෙයාකාරයකින් අර්ථ දක්වන බව ද සොයා ගැනිණ: මෙම දරිද්‍රතා සංස්කෘතිය එවැනි ප්‍රජාවන්ට ආවේණික ජීවන ක්‍රමයක් වන අතර එම නිසා දරිද්‍රතාවෙන් ගැලවීම ඔවුන්ට අභියෝගයක් වන බව අනාවරණය විය. එහෙත් වඩාත් වැදගත් කරුණ වන්නේ ප්‍රජාව පරම්පරා ගණනාවක් තිස්සේ දුප්පත්කමේ පසුවන්නේ ඉඩම් හිමිකම නොමැතිකම, දුර්වල නිවාස සහ සේවාවන්හි දුර්වල තත්ත්වය වැනි විවිධ ව්‍යුහාත්මක අසාධාරණකම් යටතේ පීඩාවට පත් වීම නිසා බව යි.

ජනාවාස තුළ ජලය වෙත ප්‍රවේශය පවතින බැවින් අසල්වැසි ප්‍රජාවන් මත රඳා පැවතීමේ අවශ්‍යතාවක් මතු නොවන නමුත් ජලය තිබෙන සමහර ස්ථාන කුල බෙදීම් අනුව වර්ග කරනු ලැබේ. ජනාවාස දෙක තුළ ම වැසිකිළි පහසුකම් නොමැති නිසා පිරිමින්ට, කාන්තාවන්ට හා ළමයින්ට එළිමහනේ මලපහ කිරීමට සිදු වේ. පදිංචි ඉඩම්වලට ඔප්පු නැති නිසා ජනයාට එවැනි ලියකියවිලි අවශ්‍ය කරන ආධාර වෙත ප්‍රවේශ විය නොහැකි ය.

දිගින් දිගට ම ගැහැණු ළමයින් හා පිරිමි ළමයින් යන දෙකොට්ඨාසය ම ද්විතීය මට්ටමේ දී පාසල් හැර යාමෙන් පෙන්නුම් කෙරෙන්නේ පාසල් වෙත පවත්නා ප්‍රවේශය සම්පූර්ණයෙන්ම ඇතුළත් කර ගැනීම පදනම් කර ගෙන මැනිය නොහැකි බව සහ පාසලේ දී ලබන අත්දැකීම ද ඒ සඳහා පදනම් කර ගත යුතු බවයි. ළමයින් විවිධ හේතු නිසා පාසල් හැර යන අතර නව වන ශ්‍රේණියේ දී විභාගය අසමත් වීම, ඔවුන්ට කුටුම්බයේ ආර්ථිකයට ලබා දිය හැකි දායකත්වය සමග සසඳන විට පාසලේ රැඳී සිටීම නිසා දැරීමට සිදු වන ඉහළ ආවස්ථික පිරිවැය, මිශ්‍ර කුල පාසල්වල දී අත්දැකීමට සිදු වන කුලය පදනම් කර ගත් වෙනස්කම් කිරීම්වලට ඇති බිය සහ දෙමව්පියන්ට තම දරුවන් අමතර පන්තිවලට යැවීමට මුදල් නොමැතිකම වැනි විවිධ හේතු ඒ අතර පවතී. පදිංචි ස්ථානය සහ කුල අනන්‍යතාව අතර ඍජු සම්බන්ධයක් පවතින අතර ජීවනෝපාය, පදිංචි ස්ථානය සහ පාසල් යාම අතර පවත්නා සම්බන්ධය ඔවුන් වඩාත් උසස් තත්ත්වයේ අධ්‍යාපනය වෙත ප්‍රවේශ වීම වළකයි. පාසල් ගුරුවරුන් පීඩිත කුල කණ්ඩායම් සම්බන්ධයෙන් උසස් කුලවල හා පන්තිවල අය දරන අදහස් පදනම් කර ගත් ආකල්ප මත කටයුතු කිරීමට යොමු වන අතර දෙමව්පියෝ තම දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධ වගකීම භාර නොගන්නා අය ලෙස බොහෝ විට දැක ගනු ලබති. එපමණක් නොව යම් යම් ප්‍රදේශවල සිසුන් ඇතුලත් ගන්නා පාසල් වලට පන්ති හා කුල අනන්‍යතාවක් ඇතිවී තිබේ.

## නිගමනය

උසස් තත්ත්වයේ අධ්‍යාපනය වෙත පවත්නා ප්‍රවේශය තීරණය වීමේ දී කුල අනන්‍යතාව දිගින් දිගට ම බලපාන අතර විශේෂයෙන් ම සනීපාරක්ෂක සේවකයන් අතර මෙම තත්ත්වය දැක ගත හැකි ය. පදිංචි ස්ථානය හා කුලය අතර පවත්නා සම්බන්ධතාව විශේෂයෙන් ම ඉඩම්වලට ඔප්පු නොමැති ජනයා සේවාවන් වෙත ප්‍රවේශ වීම වළකයි. පන්තිය හා ස්ත්‍රී පුරුෂ සමාජ භාවය ද අනන්‍යතා ලක්ෂණ වන අතර ඒවා නිසා ද පීඩිත කුල කණ්ඩායම් විශේෂයෙන් ම තනිව ජීවත් වන වැඩිහිටි කාන්තාවන් කොන් කිරීමට ලක් වේ.

## නිර්දේශ

ශ්‍රී ලාංකික සුභසාධන රාජ්‍යය තුළ දී අධ්‍යාපනය සහ ජලය සහ සනීපාරක්ෂාව යන පහසුකම් වැනි මූලික සේවාවන් වෙත සමාන ප්‍රවේශයක් ඇතැයි සැලකේ. එහෙත් අධ්‍යයනය කරන ලද ප්‍රජාවන්ගෙන් පෙනී යන්නේ මෙම සේවාවන් වෙත ප්‍රවේශ වීමේ දී කුල අනන්‍යතාව සමහර පීඩිත කුලවල ජනයා දිගින් දිගට ම මුහුණ දෙන බාධකයක් බව යි. ප්‍රමාණවත් සේවා සම්පාදනයක් නොසැලසෙන එවැනි කුල කණ්ඩායම්වලට සේවාවන් වෙත අනෙක් ප්‍රජාවන්ට සමාන ප්‍රවේශයක් සැලසෙන බව සහතික කිරීම සඳහා පහත දැක්වෙන නිර්දේශ මාලාව ඉදිරිපත් කරනු ලැබේ:

- කුලය පදනම් කර ගෙන වෙනස්කම් සිදුකිරීම පිළිබඳව ගුරු පුහුණු සැසිවල දී ඒකාබද්ධ සාකච්ඡා පැවැත්වීම. පාසල් තුළ කුලය පදනම් කර ගෙන වෙනස්කම් සිදුකිරීම සහ එම වෙනස්කම් කිරීම්වල ස්වභාවය ගැන දරන අදහස් හා හැඟීම් මැන ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය වැඩමුළු පැවැත්විය යුතු ය.

- තිරුනගර් නිවැසියන් දැනට පදිංචිව සිටින ස්ථානයේ භුක්තිය සුරක්ෂිත කළ යුතු ය. එවිට ඔවුන්ට තමන්ගේ පදිංචිය ඔප්පු කිරීමට සිදු වන වැසිකිළි ඉදි කිරීම සඳහා හෝ ආධාර වෙත ප්‍රවේශ වීම සඳහා අවශ්‍ය කරන අවසරය ලැබෙනු ඇත.

- ජනාවාස දෙක තුළ වැසිකිළි නොමැතිකම පිළිබඳව තක්සේරුවක් සිදු කළ යුතු ය. මෙය එළිමහනේ මලපහ කිරීමට සිදුව ඇති කාන්තාවන් සහ ළමයින්ගේ ආරක්ෂාව, පුද්ගලිකත්වය හා අභිමානය සහතික කිරීමට උදව් වනු ඇත.

මෙම ප්‍රකාශනය  සඳහා සහයෝගය ලැබුනේ Secure Livelihoods Research Consortium (SLRC) ආයතනය මගින් වන අතර ඊට අවැසි මුල්‍ය ආධාර එක්සත් රාජධානියේ අන්තර්ජාතික සංවර්ධන දෙපාර්තුමේන්තුව හා අයර්ලන්ත හා යුරෝපා සංගමයෙන් ලැබුණි. මෙමගින් ඉදිරිපත් වන කරුණු පර්යේෂකයන් විසින් ඉදිරිපත් කළ දෑ වන අතර මෙමගින් එක්සත් රාජධානියේ රාජ්‍ය ප්‍රතිපත්ති හෝ SLRC සහ අනෙක් ආයතනවල අදහස් ඉදිරිපත් නොවන බව සලකන්න.

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) යනු දරිද්‍රතාව ආශ්‍රිත සංවර්ධන ගැටලු පිළිබඳව දනුම හා අවබෝධය පුළුල් කිරීමට කටයුතු කරන ස්වාධීන ශ්‍රී ලාංකික බුද්ධිමතුන් කණ්ඩායමක එකතුවකි. දරිද්‍රතාව යනු වහා විසඳුම් සෙවිය යුතු සමාජ ආර්ථික, දේශපාලන හා සංස්කෘතික අසාධාරණයන් සිදුවන්නක් බව අපගේ අවබෝධයයි. දරිද්‍රතාව සම්බන්ධ ගැටලු ආමන්ත්‍රණය කිරීමට නම් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රතිපත්ති හා භාවිතයන් වෙනස් විය යුතු බව හා දරිද්‍රතාවෙන් පෙළෙන ජනයා සමග එක්ව වැඩ කළ යුතු බවට CEPA ආයතනය විශ්වාස කරයි. ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් හා ව්‍යාපෘතිවලදී දරිද්‍රතාව ආශ්‍රිත සංවර්ධන ප්‍රතිපත්තිවලට බලපෑම් කිරීම සඳහා දායක වීමට CEPA ආයතනය ප්‍රමුඛත්වය ලබා දේ.

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය
නො. 29, ආර්. ජී. සේනානායක මාවත, කොළඹ 07.
දුරකථන : +94 11 469 0200, 2676955 ෆැක්ස් : +94 11 2676959 විද්‍යුත් තැපෑල : info@cepa.lk
www.cepa.lk https://www.facebook.com/CepaSL/ https://twitter.com/cepaSL https://www.youtube.com/cepasl